ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1986 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින.]

එල්.ඩී.—ඕ. 15/85.

**ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, භෞතික විද්‍යාවේ ප්‍රවර්ධනය සහ දියුණුව සඳහා සහ ඒ ආයතනයේ පරමාර්ථ කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

ඒ ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාර්ය සඳහා ද ඒ පරමාර්ථ සහ කාර්ය කීපය වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සහ කර ගෙන යාමට හැකි වන පරිදි එකී ආයතනය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ දැනට සංස්ථාගත සාමාජික යන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සංස්ථාගත සාමාජිකයන්, "ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපිත කරනු ලබනුයේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) (i) භෞතික විද්‍යාව පිළිබඳ දැනීම සහ තොරතුරු ලබා ගැනීම, විසුරුවා හැරීම සහ හුවමාරු කර ගැනීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ;

(ii) භෞතික විද්‍යාව පිළිබඳ ආරම්භක නිවේදන සහ සාකච්ඡා ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩලයක් ඇති කිරීමෙන් ;

(iii) භෞතික විද්‍යා වෘත්තියට සම්බන්ධතාවක් ඇත් කාරණා පළ කිරීමෙන් ;

ඒ 082056—6,700 (85/02)

(iv) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාමෙන් ;

(v) භෞතික විද්‍යා අධ්‍යාපනයෙහි ලා සෑම මට්ටමකින්ම ප්‍රමිති ප්‍රවර්ධනය කර ඒවා පවත්වා ගෙන යෑමෙන් ;

(vi) භෞතික විද්‍යාත්මක පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමෙන් දිරිගැන්වීම සහ ඒවා පෝෂණය වීමෙන් ;

(vii) රටේ සංවර්ධන කටයුතුවලට භෞතික විද්‍යාව අදාළ කිරීම ප්‍රවර්ධනය කිරීමෙන්

භෞතික විද්‍යාව ද භෞතික විද්‍යාව ශ්‍රී ලංකාවෙහි භාවිතා කිරීම ද ප්‍රවර්ධනය කිරීම සහ අධිගමනය කිරීම ;

(ආ) රටේ සංවර්ධනයට භෞතික විද්‍යාව අදාළ කර ගැනීම සම්බන්ධ සියලු කාරණා කෙරෙහි රජයේ, රාජ්‍ය සංස්ථාවල, පළාත් පාලන ආයතනවල සහ වෙනත් ආයතනවල අවධානය යොමු කරවීම ;

(ඇ) ආයතනයේ සාමාජිකයන් විසින්, තම වෘත්තිය කටයුතුවල දී උසස් තත්ත්වයක් පවත්වා ගෙන යාමට වග බලා ගැනීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පිහිටි වෙනත් විද්‍යාත්මක සහ වෘත්තීය සංවිධාන සමග අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කර ගැනීම සහ අවශ්‍ය වේ නම් ඒවාට අනුබද්ධ වීමට උත්සාහ කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ භෞතික විද්‍යා වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීම සහ නංවාලීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ භෞතික විද්‍යාඥයන් සඳහා සතුටුදායක කාර්ය සහ ජීවන තත්ත්වයන් සුරක්ෂිත කර ලීම ; සහ

(උ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් යම් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් කවර වූ හෝ පියවරක් ගැනීම,

බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ, ප්‍රදානයන් හා පරිත්‍යාග පිළිගැනීමේ හෝ එකතුකිරීමේ සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිල දරන්නන්ගෙන්ද සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව සංස්ථාවේ සංස්ථාපිත සාමාජිකයන් සංස්ථාවේ වාර්ෂික මහ සභා රැස්වීමක දී එහි සාමාජිකයන් අතරෙන්, එක් එක් වර්ෂයක දී තෝරා පත්කර ගනු ලබන යම් තැනැත්තන්ගෙන්ද සමන්විත වූ සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ආයතනයේ නිල දැරූ සභාව, සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

6. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත්කර ගැනීම, ඉල්ලා අස්වීම, විශ්‍රාම ගැනීම හෝ නෙරපීම සඳහා සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒ රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම ද කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්විය යුතු ය.

7. (1) මිලදී ගැනීමෙන්, ත්‍යාග වශයෙන්, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීමෙන්, රික්ථවරණය කිරීමෙන්, තෙස්තමේන්තු දයාදයකින් හුවමාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීමේ සහ දැරීමේ ද එසේ අත්කර ගන්නා ලද හෝ දරන හෝ දේපළ නියදනය කිරීමේ ද බලය නීතියෙන් සංස්ථාවට ඇත්තේ ය. දේපළ අත්කර ගැනීමට සහ මුදල් ලබා ගැනීමට ඇති බලය.

(2) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට සංස්ථාවට බලය ඇති අතර එම මුදල් ගෙවීම ස්ථිර කිරීම සඳහා යම් උකස්කර, බැඳුම්කර හෝ ණයකර ඇති කිරීමේ, ලියා අත්සන් කිරීමේ, ප්‍රදානය කිරීමේ සහ නිකුත් කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

(3) මේ පනත යටතේ හෝ සංස්ථාවේ රීති යටතේ සංස්ථාව විසින් අත්කර ගන්නා ලද හෝ දරනු ලබන සියලු චංචල හා නිශ්චල දේපළ සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියලු මුදල්, සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා, සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාව විසින් දැරිය යුතු, පරිහරණය කළ යුතු සහ යෙදිය යුතු අතර, එකී රීතිවලට යටත්ව, ඒ දේපළ අතරින් කිසිවක්, සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන ආකාරයට, කලින් කල මිලට ගැනීමේ,

විකිණීමේ, ප්‍රදානය කිරීමේ, පවරා දීමේ, රික්ථවරණය කිරීමේ, පැවරීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ හෝ උකස් කිරීමේ බලය ද සංස්ථාවේ අරමුදල් එකී පරිදි ආයෝජනය කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

ගාස්තු සහ දායක මුදල් අය කිරීමේ බලය.

8. (අ) සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන යම් පාඨමාලාවකට හෝ විභාගයකට අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම සඳහා සාධාරණ යයි සංස්ථාව විසින් සලකනු ලබන ගාස්තු ;

(ආ) සංස්ථාවේ යම් සාමාජික පන්තියකට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු යයි සංස්ථාව විසින් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තු ; සහ

(ඇ) සංස්ථාව විසින් සපයනු ලබන සේවා සඳහා අය කිරීමට සාධාරණ යයි සංස්ථාව විසින් සලකනු ලබන දායක මුදල් සහ ගාස්තු

අයකරගනු ලැබීමට නීතියෙහි ලා සංස්ථාවට හැකි සහ සුදුසු විය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු හා ආයතනයට අය විය යුතු ණය.

9. මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ ආයතනයෙහි පවත්නා සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු හෝ බේරුම් කරනු ලැබිය යුතු අතර ආයතනයට අයවිය යුතු සියලුම ණය සහ ආයතනය වෙත ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

කමිටු පත් කිරීම.

10. යම් කමිටුවක් පත්කිරීමේ බලය සංස්ථාවට ඇති අතර, භෞතික විද්‍යාඥයන් වශයෙන් ශ්‍රී ලංකාවේ වෘත්තියේ යෙදී සිටින හෝ ක්‍රියා කරන තැනැත්තන් අතර වෘත්තීය සම්මතයන් හා විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් පියවර කලින් කල ගැනීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන වග.

11. සභාව විසින්, කලින් කල, බලය පවරනු ලබන තැනැත්තන් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය,